# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,112 - 2019 පෙබරවාරි මස 22 වැනි සිකුරාදා - 2019.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

## තනතුරු ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ භාෂාවෙන් උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — යාපනය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතුය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 මාර්තු මස 15 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 ජනවාරි මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| යාපනය | උඩුවිල් | වලි දකුණ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |
| යාපනය | උඩුවිල් | ඒලාලෙයි කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වලි දකුණ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය. |

02-641

## විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017 (2019)**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ පස් සමීක්ෂක/කාර්මික නිලධාරි තනතුරුවල iii ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගයට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2019.03.22 වන අතර 2019 ජුනි මස දී විභාගය පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

| තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 01. පස් සමීක්ෂක | 02 |
| 02. කාර්මික නිලධාරි | 01 |

02.1 - විවෘත පදනම මත බඳවා ගැනීම :

02.1.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2019.03.22 දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර 30ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2001.03.22 දිනට හෝ ඊට පෙර හා 1989.03.22 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

02.1.2 විභාගයට ඉදිරිපත් වන අපේක්ෂක අපේක්ෂිකාවන් පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

| තනතුරට අදාළ සංකේත අංකය | තනතුර | 02.1.3 අධ්‍යාපන සුදුසුකම් | | 02.1.4. වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| | | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) | |
| 1 | පස් සමීක්ෂක | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ සහිතව එකවර විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම | කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර) | තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව; *හෝ* රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම; *හෝ* උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියීක හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| 2 | කාර්මික නිලධාරි | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථයන් සහිතව එකවර විෂයයන් 06කින් අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්වීම | ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත් වීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර) | පහත සුදුසුකම් අතුරින් තනතුරට අදාළවන ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් ලබා තිබිය යුතු වේ. (i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව; *හෝ* (ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව; *හෝ* (iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව; *හෝ* (iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව; *හෝ* |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මාර්තු මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

| තනතුරට අදාළ සංකේත අංකය | තනතුර | 02.1.3 අධ්‍යාපන සුදුසුකම් | | 02.1.4. වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| | | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) | |
| | | | | (v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;<br>*හෝ*<br>(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;<br>*හෝ*<br>(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

02.1.3 වෙනත් සුදුසුකම් :

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති බවට සහතික විය යුතුය. :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත අයකු විය යුතුය.
- යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තරම් සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතුය.

03. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිග නු ලබන්නේ අයදුම්කරු සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

04. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව පුරප්පාඩු සංඛ්‍යාව 03ට අඩු බැවින් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි. තවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට හෝ පත්වීම් බලධාරියාට බලය ඇත.

**වැටුප් හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :**

වැටුප් කේත අංකය : MN 03/2016
වැටුප් පරිමාණය : රු.31,040-445 x 10 - 660 x 11-730 x 10-750 x 10-57,550

2020.01.01 දින දක්වා වැටුප්, වැටුප් වර්ධක හා දීමනා ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට අනුකූලවයි.

III ශ්‍රේණියට බඳවා ගෙන වසර 3ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද II වන ශ්‍රේණියට උසස්වී වසර 3ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයද I වන ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව ද සමත්විය යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරියකු විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබාගත යුතුය. තනතුර සඳහා නියම කර ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය රා.ප.ච. 1/2014 හා එහි සංශෝධන අනුව ලබාගත යුතුවේ. මෙම රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා නොගැනීම හා කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත කාලය තුළ සමත් නොවීම ඉදිරි වැටුප් විලම්භනය වීමට හේතුවනු ඇත.

05. *සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :*

(I) මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(II) නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(III) අංක 1930/12 දරන 2015.09.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත දූනට බලාත්මක ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ හා බඳවා ගැනීම් පරිපාටිවල සංශෝධනවලද ඔබ යටත් විය යුතුය.

06. *අයදුම්කළ යුතු ක්‍රමය :*

(*අ*) මෙම විභාගය සඳහා වූ අයදුම්පත් ආකෘතිය මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. ඒ අනුව අයදුම්පත A4 (21cmx29cm) පරිමාණයේ කඩදාසියක පමණක් දෙපැත්තේම පිළියෙල කළ යුතුවේ. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සි 03 තෙක් පළමුවන පිටුවටද 04 සිට 06 තෙක් දෙවන පිටුවට ද 07 සිට 10 තෙක් තෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත් පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත *ගැසට්* නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

(*ඇ*) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.03.22 දින හෝ දිනට ප්‍රථම කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්, පාලන 01 ශාඛාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(*ඈ*) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2017(2019) පස් සමීක්ෂක/කාර්මික නිලධාරි'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(*ඉ*) අපේක්ෂකයකුට එක් තනතුරකට පමණක් අයදුම් කළ හැකි අතර එක් තනතුරක් සඳහා විභාග ගාස්තුව රු. 600 කි. එම මුදල කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ මහජන බැංකුවේ 057-1001-7-902-7204 දරන ගිණුමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා කුවිතාන්සිය (මුල් පිටපත) එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. එම ලදුපතේ ඡායා පිටපත් ළඟ තබාගැනීම මතුවට ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

(*ඊ*) අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේදී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(*උ*) ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රජයේ තනතුරක් දරන අයදුම්කරුවකු විභාගයට ඉල්ලුම් කරන විට තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු ලවා සහතික කරවාගත යුතුය.

(*ඌ*) දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වුවත් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. *විභාග පරිපාටිය :*

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින මාධ්‍යය, නගරය හා ඉල්ලුම් කරන තනතුර ද, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(*ආ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන, ආයතනික හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපතක් ද විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපතක්ද අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, ඉල්ලුම් කරන ලද විභාගයේ නම, ඔබගේ නම ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීමද වඩාත් ඵලදායි වනු ඇත.

(*ඇ*) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(*ඈ*) *අනන්‍යතාව* - තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම එකක් පිළිගනු ලැබේ.

(I) ජාතික හැඳුනුම්පත; හෝ
(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය; හෝ
(III) වලංගු රියදුරු බලපත්‍රය.

(*ඉ*) *විෂය නිර්දේශය :*

1. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 1යි, මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වය. ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන්, තීරණය කිරීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිළියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

2. විෂයානුබද්ධ දැනුම (කාලය පැය 2 යි, මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ විෂයානුබද්ධ දැනුම පිළිබඳ ව්‍යුහගත ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි.

| | *තනතුර* | *විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය* |
|---|---|---|
| 1. | පස් සමීක්ෂක | ශ්‍රී ලංකාවේ පස් වර්ග හා ඒවායේ පැතිරීම/ පස සෑදීමට බලපාන සාධක, පාංශු පැතිකඩ හඳුනා ගැනීම/ සිතියම් කියවීම/ ශ්‍රී ලංකාවේ වර්තමාන ඉඩම් පරිහරණ රටාව/වන විනාශයේ බලපෑම හා පාරිසරික ගැටලු/ පොහොර භාවිතය/බෝග විවිධාංගි කරණය/පාංශු ජල සංරක්ෂණ ක්‍රම |
| 2. | කාර්මික නිලධාරි | පෑස්සුම්/කම්මල් වැඩ/වඩු වැඩ/වැඩපල යන්ත්‍ර/තහඩු වැඩ/කැපුම්තල/ද්‍රව්‍ය ගුණ හා සරල ගණනය කිරීම්/මෝටර් යන්ත්‍ර විද්‍යාව/විදුලි ඉංජිනේරු විද්‍යාව/යන්ත්‍රාගාර/ ආරක්ෂිත ක්‍රම/ඉගැන්වීමේ ක්‍රම |

(*ඊ*) *මාධ්‍යය :*

විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලිනි. අපේක්ෂකයින් විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(*එ*) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

(*ඒ*) *විභාගය පවත්වන ස්ථානය හා දිනය :*

මෙම විභාගය 2019 ජූනි මාසයේ දී කොළඹ දී හා මහනුවර දී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ. යම් හෙයකින් ප්‍රමාණවත් අපේක්ෂක සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුවහොත් කොළඹ දී පමණක් විභාගය පැවැත්වීමට කටයුතු කරනු ඇත. (ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

| විභාග මධ්‍යස්ථානය | සංකේත අංකය |
|---|---|
| කොළඹ | 1 |
| මහනුවර | 2 |

08. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණු කුසලතාවය මත සකස් කළ ප්‍රතිඵල ලේඛනය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

(ii) ඉහත විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම් සඳහා සලකා බලනු ලැබේ.

(iii) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම විභාග යේ ලකුණු කුසලතා පදනම් කරගෙන අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරා ඇති අය පමණක් පුරප්පාඩු සඳහා තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනමනු නොලැබේ.)

(iv) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

(v) තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනට සම්පූර්ණ කර නොමැතිව තිබිය දී විභාගයට ඉදිරිපත්ව විභාගය සමත් වුව දසම්මුඛ පරීක්ෂණය සඳහා සලකා නොබලන අතර කිසිදු දැනුම් දීමකින් තොරව ඔහුගේ/ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) ව්‍යාජ තොරතුරු හා කූඨ ලේඛන ඉදිරිපත් කර යම් අයකු පත්වීමක් ලබාගත්තේ වුවද ඒ බව අනාවරණය වූ වහාම ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කිරීමට හා ඔහුට/ඇයට විරුද්ධ නිත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

(viii) ප්‍රතිඵල නිකුත් කිරීම - එක් එක් විෂයයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා සමත් අපේක්ෂකයින්ගේ ලේඛනයක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ දූනුම්දීම අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාදෙනු ඇත.

09. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අචාර්ය ඩබ්. එම්. ඩබ්. වීරකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*).

2019 පෙබරවාරි මස 02 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ ඉල්ලුම්පත්‍රය**

*කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017 (2019)*

Application for Open Competitive Examination for Recruitment to Vacancies in the Grade III of the Sri Lanka Technological Service in the Department of Agriculture - 2017(2019)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය -
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින විභාග මධ්‍යස්ථානය -
කොළඹ - 1
මහනුවර - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරනු ලබන තනතුර

පස් සමීක්ෂක - 1
කාර්මික නිලධාරි - 2

| තනතුර | අංකය |
|---|---|
| | |

(අදළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උද.* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උද : GUNAWARDHANA, H. M. S. K.)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.5 දුරකතන අංකය : | | | | | | | | | | |

02. ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
2.2 සිංහලෙන්/දෙමළෙන් :————.
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
2.4 පදිංචි දිස්ත්‍රික්කය :————————.
2.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදළ අංකය කොටුව තුළ ලියන්න)

04. 4.1 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

4.2 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : | | | | | මාස : | | | දින : | | |

4.3 විවාහක/අවිවාහක බව
අවිවාහක - 1
විවාහක - 2
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

05. අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍ය සමග) :

(අ) *අ.පො.ස. (සා/පෙළ) විභාගය* :

(i) වර්ෂය හා මාසය :————————.
(ii) විභාග අංකය :————————.
(iii) භාෂා මාධ්‍යය :————————.
(iv) විභාග ප්‍රතිඵල :————————.

| | *විෂයයන්* | *සාමර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ආ) *අ.පො.ස. (උ/පෙළ) විභාගය*

(i) වර්ෂය හා මාසය :————————.
(ii) විභාග අංකය :————————.
(iii) භාෂා මාධ්‍යය :————————.
(iv) විභාග ප්‍රතිඵල :————————.

| | *විෂයයන්* | *සාමර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

06. *වෘත්තීය සුදුසුකම්* :

| *ඩිප්ලෝමාව* | *ඩිප්ලෝමාව නිකුත් කළ ආයතනයේ නම* | *සමත් වූ වර්ෂය* | *මාධ්‍යය* | *විභාග අංකය* | *ඩිප්ලෝමාව වලංගු දිනය* |
|---|---|---|---|---|---|
| | | | | | |

07. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————————.

7.1 ගාස්තු ගෙවන ලද දිනය :————————.

7.2 ලදුපත් අංකය :————————.

7.3 මුදල :————————.

විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ එක් පසෙකින් පමණක් අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

08. *අයදුම්කරුගේ සහතිකය* :

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරාගැනීමට පෙර දැන ගතහොත්, මා නුසුදුස්සකු වීමට යටත් වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. එසේම මා විසින් ඉල්ලුම්කරන තනතුර සඳහා එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන බවට ද සහතික වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

09. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ...................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

10. *දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා* : (අනවශ්‍ය වචන කපා හරින්න)

ඉහත විස්තර දක්වෙන අයදුම්කරුට/අයදුම්කාරියට මෙම විභාගය සඳහා පෙනී සිටීමට *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති/නැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

02-751

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ජාතික ප්‍රතිපත්ති,ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියට උසස් කිරීම මත පත් කිරීම***

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ වූ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ පුරප්පාඩු 40ක් පිරවීම සඳහා එම සේවයේ II පන්තියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක 01 සිට 13.1 පළමුවන පිටුවටද, 13.2 සිට 15දක්වා දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිදි දෙපැත්තම භාවිතා කරමින් සකස් කරන ලද අයදුම්පත් 2019.03.15 දිනට පෙර ලැබෙන සේ තැ.පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියට උසස්කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

1. වැටුප් හා දීමනා :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව SL-1- 2016 රු. 47,615-10 x 1335-8 x 1630-17 x 2170-110,895 වැටුප් පරිමාණයේ I පන්තියට හිමි රු. 52523 ක මාසික වැටුප හිමි වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II උපලේඛනය පරිදි පත්කරන දිනට වැටුපෙහි පිහිටුවනු ලැබේ. අංක 415 හා 1986.08.15 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින් වර කරනු ලැබූ සංශෝධනයන්හි සඳහන් පරිදි හා මෙම ව්‍යවස්ථාවට ඉදිරියේදී කරනු ලබන සංශෝධනයන්හි සඳහන් පරිදි අදාල කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට යටත්ව වැටුප් වර්ධක ගෙවනු ලැබේ.

2. *අවශ්‍ය සුදුසුකම් :*

2.1 පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයක් හෝ සමාන සුදුසුකම් සහිතව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ යටත් පිරිසෙයින් එක් වසරක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා එම තනතුරෙහි ස්ථිර කර තිබීම.

හෝ

2.2 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ යටත් පිරිසෙයින් පස්වසරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම හා එම තනතුරෙහි ස්ථිර කර තිබීම. (''සතුටුදායක සේවා කාලය'' යනුවෙන් අදහස් කරනු ලබන්නේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වර්ෂ 05ක් තුළ සියලු වැටුප් වර්ධක නියමිත පරිදි උපයාගෙන තිබීම හා එම කාලසීමා තුළ සිදුකළ කිසියම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීම් හැර) විනය පරීක්ෂණයක් මත කරන ලද දඬුවමකට භාජනය වී නොතිබීමයි.)

3. පහත සඳහන් ලේඛන හා අනෙකුත් සුදුසුකම් සනාථ කිරීමට අදාළ ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. :

(අ) උප්පැන්න සහතිකය;
(ආ) උපාධි සහතිකය හෝ පශ්චාත් උපාධි සහතික හෝ වෙනත් අධ්‍යාපනික සහතික;
(ඇ) II පන්තියට උසස් කිරීමේ ලිපිය;
(ඈ) II පන්තියේ උපලේඛනගත තනතුරට ස්ථිරව පත් කිරීමේ ලිපි;
(ඉ) කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා ඉදිරිපත් කළ සුදුසුකමට අදාල සහතිකය.

4. සියලුම අයදුම්කරුවන් **දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්** ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම, උතුරු පළාත් සංවර්ධන, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත පමණක් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

5. පහත සඳහන් ලකුණු දීමේ පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් ඉදිරිපත් විය යුතු අතර, එහිදී පහත සඳහන් ලකුණු පටිපාටිය අනුව ලබා ගන්නා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කරනු ලැබේ.

6. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

*ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියට පත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය*

සම්මුඛ පරීක්ෂණය සඳහා මුළු ලකුණු 100

1. *සේවා පළපුරුද්ද* - ලකුණු 40

1.1 පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ සමාන සුදුසුකම් සහිතව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ වසර 01ක සතුටුදායක සේවා පළපුරුද්දෙන් පසුව එළඹෙන,

(i) එක් වසරක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 04 බැගින්,
(ii) මාස 06ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 02 බැගින්,
(iii) මාස 03 ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 01 බැගින්,

**උපරිම ලකුණු 40**

හෝ

1.2 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දෙන් පසුව එළඹෙන,

(iv) එක් වසරක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 04 බැගින්
(v) මාස 06 ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 02 බැගින්
(vi) මාස 03ක සතුටුදායක සේවා කාලයක් සඳහා - ලකුණු 01 බැගින්

**උපරිම ලකුණු 40**

(සේවා කාලය අයදුම්පත් භාරගන්නා අවසාන දින දක්වා සලකා බලනු ලැබේ.)

2. *කුසලතාවය සඳහා* - ලකුණු 60

2.1 ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් සඳහා, **උපරිම ලකුණු 20**

2.1.1 (ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 12.1 යටතේ I පන්තියට පත්කිරීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම් වන පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට අමතරව සම්පූර්ණ කර ඇති උපාධිය සඳහා පමණක් ලකුණු ලබාදිය යුතුය. ඉහත සඳහන් පශ්චාත් උපාධි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත ඒවා විය යුතුයි.)

ආචාර්ය උපාධි PhD -20
පශ්චාත් උපාධි ( M.Sc, MBA, MEng,MPhil, MA, MSsc . . . . ) -15
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (වසර 01ට නොඅඩු) -10
(කාර්යක්ෂමතා කඩඉම් සඳහා ඉදිරිපත් කර ඇති පශ්චාත් උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.)

2.1.2 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 12.2 යටතේ I පන්තියට පත්කිරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා,

ආචාර්ය උපාධි PhD -20
පශ්චාත් උපාධි ( M.Sc, MBA, MEng,MPhil, MA, MSsc . . . . ) -15
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (වසර 01ට නොඅඩු) -10
(කාර්යක්ෂමතා කඩඉම් සඳහා අදාළ කරගත් ඇති පශ්චාත් උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.)

2.2 II පන්තියේ උපලේඛනගත තනතුරක (ස්ථිර) ලබා ඇති පරිපාලන පළපුරුද්ද සඳහා අවුරුද්දකට ලකුණු 03 බැගින්

**උපරිම ලකුණු 15**

2.3 ක්ෂේත්‍රයට අදාළව ප්‍රකාශයට පත් කර ඇති ස්වාධීන හෝ කණ්ඩායම් පර්යේෂණ (මෙහිදී පර්යේෂණ, පර්යේෂණ පත්‍රිකා, පර්යේෂණ ග්‍රන්ථ, පර්යේෂණ නිබන්ධන සලකා බලනු ලැබේ.)
වෙනත් ග්‍රන්ථ හා එළිදක්වා ඇති නවනිපැයුම් සඳහා එකකට ලකුණු 05 බැගින්.

**උපරිම ලකුණු 15**

(අදාළ සුදුසුකම් තහවුරු කිරීම සඳහා අදාළ පරිදි පර්යේෂණ ග්‍රන්ථ, පර්යේෂණ නිබන්ධන, පර්යේෂණ පත්‍රිකා සහ/හෝ පේටන්ට් බලපත්‍ර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ දී ඉදිරිපත් කළ යුතු අතර, එම නිර්මාණ ප්‍රකාශයට පත් කර ඇති බව/එළිදක්වා ඇති බව එහි දී තහවුරු කළ යුතු ය. උපාධි පාඨමාලා වෙනුවෙන් ඉදිරිපත් කරන ලද නිබන්ධන සලකා බලනු නොලැබේ.)

2.4 පොදු 230 බී ආකෘතිය අනුව ලබා ඇති ප්‍රශංසාවක් සඳහා ලකුණු 01 බැගින්

**උපරිම ලකුණු 05**

2.5 සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය **උපරිම ලකුණු 05**
සන්නිවේදන හැකියාව - ලකුණු 02
නායකත්වය - ලකුණු 02
පෞරුෂත්වය - ලකුණු 01

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

වී. සිවඥාණසෝති,
ලේකම්,
ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම, උතුරු පළාත් සංවර්ධන, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ යෞවන කටයුතු අමාත්‍යාංශය.

අංක 354/2, ''නිපුණතා පියස'',
1 වැනි මහල,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියට පත් කිරීම සඳහා අයදුම්පත්‍රය**

1. නම (මුලකුරු සමග) :—————.
2. සම්පූර්ණ නම :—————.
3. කාර්යාලීය ලිපිනය :—————.
4. පෞද්ගලික ලිපිනය :—————.
5. දුරකථන අංකය :—————.
6. උපන්දිනය :—————.
7. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :—————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
9. විවාහක/අවිවාහක බව :—————.
10. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියට පත්වූ දිනය :—————.
11. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ මුල් පත්වීමේ දිනය :—————.
12. 12.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මුළු සේවා කාලය :—————.
12.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට II පන්තියේ සේවා කාලය :—————.

13. අධ්‍යාපන සුදුසුකම් :

13.1 අ.පො.ස. (සා.පෙ.) වර්ෂය :—————.

| | විෂයයන් | සාමාර්ථය | | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1. | | | 5. | | |
| 2. | | | 6. | | |
| 3. | | | 7. | | |
| 4. | | | 8. | | |

13.2 අ.පො.ස. (උ.පෙ.) වර්ෂය :—————.

| | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

13.3 ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :

| | *උපාධියේ නම* | *ක්ෂේත්‍රය* | *උපාධිය වලංගු වන දිනය* |
|---|---|---|---|
| 1. | ආචාර්ය උපාධිය | | |
| 2. | ශාස්ත්‍රපති/විද්‍යාපති | | |
| 3. | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | |
| 4. | විද්‍යාවේදී/ශාස්ත්‍රවේදී | | |

13.4 කාර්යක්ෂමතා කඩඉම සඳහා සලකා බලන ලද පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ නම සහ ක්ෂේත්‍රය :
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

14. වෘත්තීය සුදුසුකම්
14.1 දැනට දරන තනතුරුවලට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ලබා ඇති වෘත්තීය සුදුසුකම් :
1. .....................................................................................................
2. .....................................................................................................
3. .....................................................................................................

14.2 වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ ලබා ඇති වෘත්තීය සුදුසුකම් :
1. .....................................................................................................
2. .....................................................................................................
3. .....................................................................................................

15. ආයතන පරිපාලනය පිළිබඳව ලබා ඇති සුදුසුකම් :.........................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

16. සුපිළිපන්න භාවය පිළිබඳ ලබා ඇති සහතික/ප්‍රශංසා පිළිබඳ විස්තර :.................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

17. සිදු කර ඇති පර්යේෂණ හෝ එළි දක්වා ඇති නව නිපැයුම් පිළිබඳ විස්තර :.........................
.....................................................................................................
.....................................................................................................

උක්ත තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මාගේ සේවා කාලය තුළ කිසිදු විනය විරෝධී ක්‍රියාවක් සඳහා සම්බන්ධවී හෝ දඬුවම් ලබා නොමැති බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම දෙපාර්තමේන්තුවේ/තාක්ෂණ විද්‍යාලයේ/කාර්මික විද්‍යාලයේ සේවය කරන ................................ මහතා/මිය/මෙනවිය ඉහත සඳහන් කර ඇති විස්තර නිවැරදි බවත් ඔහු/ඇය සේවා කාලය තුළ විනය කටයුත්තක් සඳහා දඬුවම් ලබා නොමැති බවත් සහතික කරමි.

————,
අධ්‍යක්ෂ ජනරාල්.

දිනය :—————.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.
නිල මුද්‍රාව

02-847

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 (I)

අංක 1925/37 හා 2015.07.28 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019 මැයි මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගයට අදාළ විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන ඉහත සඳහන් ව්‍යවස්ථාවේ උපලේඛන III යටතේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථාවලදී හෝ පෙනී සිටිය හැක.

03. *විභාග පටිපාටිය - ලිඛිත පරීක්ෂණය*

| *විෂයය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය (පැය)* |
|---|---|---|---|
| 01 | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු | 100 | 1 1/2 |
| 02 | මුදල් රෙගුලාසි | 100 | 1 1/2 |
| 03 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය | 100 | 02 |
| 04 | ඉංග්‍රීසි භාෂාව | 100 | 02 |

04. *විෂයය නිර්දේශය :*

| *විෂයය අංකය* | *විෂයය* | *විෂයය අන්තර්ගතය* |
|---|---|---|
| 01 | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු | රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxvii, xxx සහ xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති i, iii, iv, v, vi, viii, x, xii යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව |
| 02 | මුදල් රෙගුලාසි | රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ i, ii, v, viii, xii හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව |
| 03 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය | අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ. |
| | | (i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (අධ්‍යාපනයේ නව මග) |
| | | (ii) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව |
| | | (iii) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වන වාර්තාව |
| | | (iv) 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ |
| | | (v) 1999 සිට ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (ප්‍රාථමික ද්විතීයික හා අ.පො.ස.(උ.පෙළ)) |
| | | (vi) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත |
| | | (vii) 1986 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත |
| | | (viii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත |
| | | (ix) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත |
| | | (x) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාර්ය පනත |
| | | (xi) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
| 04 | ENGLISH LANGUAGE | This is to assess the English language competence of the following subject areas |
| | | **-English Grammar** :- |
| | | Tense and Number, Sentences (Simple/ Compound / Complex/ Compound Complex) Relative Clauses, Adjectives and Adverbs, prepositions |
| | | **-Communication Skills** :- |
| | | General Greeting and Introductions, Giving and getting information, Advising, Suggesting and Expressing and Opinions, Telephone Skills, Interviewing Skills, Meeting |
| | | **-Writing Skills** :- |
| | | Internal modes of communication, Formal correspondence skills, Writing Descriptions/Explanation, Summary Writing skills, Report Writing skills |

***සැ.යු.***- අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් ලකුණු 40% ක ප්‍රමාණයක් ලබා ගත යුතුය. අපේක්ෂකයෙකුට එක් අවස්ථාවකදී එක් විෂයයකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පෙනී සිට සමත්විය හැකිය.

***සටහන.***-උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයන් හදාරා ඇති විට මෙම කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇති ඉංග්‍රීසි විෂයය සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ.

05. *විභාගයේ භාෂා මාධ්‍ය* :-

5.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. විභාගය සඳහා ඉල්ලුම්කරනු ලැබූ භාෂා මාධ්‍ය පසුව වෙනස්කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.2 තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයෙකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස රජයේ සේවයට ඇතුළු වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතුය.

5.3 අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

06. අයදුම්පත්‍රය මෙහි දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඒ 4 (A4)ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ශීර්ෂ අංක 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු පිටුවටද වන ලෙස සකසා ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙළ කිරීමේදී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල මාධ්‍ය අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද, දෙමළ මාධ්‍ය අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කර බැලිය යුතුය. එසේම නියමිත විභාග ගාස්තුව ගෙවා එකී විස්තර අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ සඳහන් කර ලදුපත අමුණා ඇත්ද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතු අතර අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

07. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

08. *ව්‍යාජ තොරතුරු සැපයීම සඳහා දඬුවම්.*-ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ විධිවිධාන අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව, ව්‍යාජ තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

09. අයදුම්පත්‍ර 2019 වර්ෂයේ මාර්තු මස 22 හෝ ඊට පෙර " විභාග කොමසාරිස් ජනරාල්,සංවිධාන(ආයතනික විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019(I) " යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

10. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් මෙම විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. එම නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 02 ක් හෝ 03 ක් ඇතුළත තම ප්‍රවේශපත්‍රය නොලැබුණිනම් පුවත්පත් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීමේ ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වේ.විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. ඉහත 10 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.

12. අයදුම්පත්‍රයේ ද, විභාග සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිම අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

13. විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම විභාග අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
හෝ
(iii) වලංගු රියදුරු බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

14. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

15. විභාග ගාස්තු :

(අ) මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතු ය.

(i) පළමු වැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.
(ii) ඊට පසු එක් වතාවක් සඳහා පහත සඳහන් පරිදි විභාග ගාස්තු අයකරනු ලැබේ.
සම්පූර්ණ විභාග ගාස්තුව රු.500/- කි
එක් විෂයයකට ගාස්තුව රු.250/- කි

(ආ) මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හෝ වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත එහි දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අලවා එවිය යුතුය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

(ඇ) විභාග ගාස්තුව සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවීමක් සිදු නොකරන අතර එම ගාස්තුව වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමකට ඉඩ දෙනු නොලැබේ.

16. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

17. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතින බව පෙනී යන්නේ නම් සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

19. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කවර කරුණක් පිළිබඳ වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

